# සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**නිවාඩු කාලීන පැවරුම්**

**සැකසුම-මාවනැල්ල අධ්‍යාපන කලාපය**

# 3 ශ්‍රේණිය - පරිසරය (අගෝස්තු -2 සතිය)

## 1 1 තේමාව - වැඩ පහසු කිරීමේ මං

**පුංචි දරුවනි, ඔබ මේ ක්‍රියාකාරකම කර බලන්න.**

- කඩදාසියක වෘත්ත දෙකක් ඇඳ ගන්න. එහි එක් වෘත්තයක් අතින් ඉරා වෘත්තයක් ලබා ගන්න. අනෙක් වෘත්තය කතුරෙන් කපා ගන්න.
- දැන් පහත අලවන්න

- වඩා ක්‍රමාණුකූල ව හා පහසුවෙන් වෘත්තය ලබා ගැනීමට හැකි වූයේ කතුරෙන් කැපීමෙන් බව අවබෝධ වුණා නේද?
- එසේනම් වැඩ පහසු කර ගැනීමට විවිධ උපකරණ භාවිතා කරයි.
- පන්ති කාමරයේ ඇති වැඩ පහසු කරන උපකරණය හා එහි කාර්යය හඳුනා ගන්න.

උදා :-

| උපකරණය | ඉටුකරගත හැකි කාර්යය |
|---|---|
| ස්ටෙප්ලරය | කඩදාසි කිහිපයක් එකට එකතු කර ගැනීමට. |
| පන්චරය (සිදුරු විදිනය) | කඩදාසි සිදුරු කර ගැනීමට. |
| කතුර | යමක් කපා ගැනීමට. |
| කටරය | පැන්සල් උල් කිරීමට. |

E nanapiyasa 3 ශ්‍රේණිය පරිසරය -11 තේමාවට අදාල වීඩියෝව නරඹන්න.